NORTON ROSE FULBRIGHT

# 2014 ජනවාරි 31 දින ඕස්ට්‍රේලියානු සංක්‍රමණ රැඳවුමේ සිටින සියළුම අය වෙත කරන දැන්වීම

## මෙය ඔබගේ අයිතිවාසිකම්වලට බලපෑ හැකි දැන්වීමකි.

**මෙම දැන්වීම පහළ භාෂාවලින් ලබාගත හැක: www.immigrationdatabreach.com.au.**

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| අරාබි | අසර්බයිජාන් (උතුර) | බෙංගලි | බුරුම | කැන්ටනීස් | දාරි | හසරගි |
| හිංදි | ඉන්දුනීසියානු | කුර්දිෂ් (කුර්මන්ජි) | කුර්දිෂ් (සොරානි) | මැන්ඩරීන් | පෂ්ටෝ | පර්සියන් |
| පන්ජාබි | සිංහල | සිල්හෙටි | දෙමළ | උර්දු | උස්බෙක් | වියට්නාමීස් |

## 1 මෙම දැන්වීම කුමක් සම්බන්ධයෙන්ද?

*<u>දත්ත කඩවීම සම්බන්ධ පසුබිම</u>*

1.1 මෙම දැන්වීම *(notice)* දැනට Department of Home Affairs (දෙපාර්තමේන්තුව) ලෙස හඳුන්වන Department of Immigration and Border Protection ඔස්සේ සිදුවූ දත්ත කඩවීම සම්බන්ධයෙනි.

1.2 2014 පෙබරවාරි 10 වන දින, එම වෙබ් අඩවියේ දළ වශයෙන් පුද්ගලයන් 9,000 ක පමණ පුද්ගලික තොරතුරු ඇතුලත් ස්ප්‍රෙඩ්ෂීට් එකක් පළවිය. එම පුද්ගලයන් සංක්‍රමණ හෝ වෙනත් රැඳවුම්වල සිටින ලදී. එම ස්ප්‍රෙඩ්ෂීට් එක මෙමම වෙබ්අඩවියේ පළ නොකල යුතුව තිබිණි. එය අත් වැරැද්දකින් සිදුවූ දෙයකි. ඔබගේ නම සහ ලිපිනය ආදී පුද්ගලික තොරතුරු අත් වැරැද්දකින් පළවීම දත්ත කඩවීමක් (*Data Breach*) ලෙස හඳුන්වයි.

1.3 පුද්ගලික තොරතුරු 2014 පෙබරවාරි 19 දින දෙපාර්තමේන්තු වෙබ්අඩවිය වෙතින්ද, 2014 පෙබරවාරි 27 දින දෙපාර්තමේන්තුවේ ඓතිහාසික වෙළුමකින්ද ඉවත් කරන ලදී.

*<u>Office of the Australian Information Commissioner වෙත ඉදිරිපත් කරන ලද පැමිණිල්ල</u>*

1.4 2015 අගෝස්තු 30 වන දින දත්ත කඩවීම මගින් අගතියට පත් පුද්ගලයන් වෙනුවෙන් Office of the Australian Information Commissioner (**OAIC**) වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කරන ලදී. ඕස්ට්‍රේලියානු තොරතුරු කොමසාරිස්වරයා විසින් පැමිණිල්ල විමර්ශනය කරන ලදී.

1.5 2018 ජනවාරි 24 වන දින, දත්ත කඩවීම මගින් අගතියට පත් සියළු දෙනා හට OAIC මගින් දැන්වීමක් (මෙම දැන්වීම ආකාරයේ) නිකුත් කරන ලදී (**පළමු දැන්වීම**). පළමු දැන්වීම මගින් දත්ත කඩකිරීම මගින් ඇතිවූ බලපෑම සම්බන්ධ තොරතුරු විමසන ලදී.

1.6 2021 ජනවාරි 11 වන දීන, ඕස්ට්‍රේලියානු තොරතුරු කොමසාරිස්වරයා තීරණය කලේ:

(1) දත්ත කඩවීම මගින් අගතියට පත් පුද්ගලයන්ගේ පුද්ගලිකත්වය සම්බන්ධයෙන් අයුතු ලෙස මැදිහත්වූ බව; සහ

(2) දත්ත කඩවීම මගින් අගතියට පත් පුද්ගලයන් හට දත්ත කඩ කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් සිදුවූ පාඩුව හෝ අලාභ සඳහා වන්දි ලබා ගත හැකි බවයි.

1.7 ඕස්ට්‍රේලියානු තොරතුරු කොමසාරිස්වරයාගේ තීරණය Administrative Appeals Tribunal (**AAT**) වෙත අභියාචනා කරන ලදී. 2023 සැප්තැම්බර් 13 වන දින, AAT මගින් දත්ත කඩවීම මගින් අගතියට පත් පුද්ගලයන්ගේ වන්දි ඇගයීම සම්බන්ධ නව ක්‍රියාවලියක් නියම කරන ලදී. මෙම ක්‍රියාවලිය වන්දි ඇගයීමේ වැඩපිළිවෙල *(Compensation Assessment Scheme)* ලෙස හැඳින්වේ.


© Norton Rose Fulbright Australia

*වන්දි ඇගයීමේ වැඩපිළිවෙල*

1.8 AAT තීරණය අනුව දත්ත කඩකිරීම මගින් අගතියට පත් පුද්ගලයන්ගේ වන්දි ගෙවීම ස්වාධීනව ඇගයීම සම්බන්ධයෙන් Norton Rose Fulbright Australia (**NRFA**) නීති සමාගම වෙත ප්‍රදානය කරන ලදී.

1.9 මෙම දැන්වීම වන්දි ඇගයීමේ වැඩපිළිවලේ පළමු පියවරයි.

## 2 මා විසින් කුමක් කල යුතුද?

2.1 දත්ත කඩවීම මගින් ඔබට කිසිදු අලාභයක් හෝ පාඩුවක් සිදු නොවුනේ නම්, ඔබ හට වන්දි ලබා ගැනීමට සුදුසුකම් නැත. ඔබ විසින් මෙම දැන්වීමට ප්‍රතිචාර දැක්වීම අවශ්‍ය නැත.

2.2 දත්ත කඩවීම මගින් මගින් ඔබට කිසිදු අලාභයක් හෝ පාඩුවක් සිදුවූයේ නම්, හෝ ඔබට ඒ සම්බන්ධයෙන් සැකයක් ඇතිනම්, වන්දි ඇගයීමේ වැඩපිළිවෙල යටතේ වන්දි ඉල්ලා සිටීමට ඔබ බලාපොරොත්තු වන්නේ නම්, මෙම සම්බන්ධතාවය ඔස්සේ ඇති මාර්ගස්ථ පෝරමය (***Response Form***) සම්පූර්ණ කර මෙම දැන්වීමට ප්‍රතිචාර **<u>දැක්විය යුතුය</u>**: **www.immigrationdatabreach.com.au**

අලාභ හෝ පාඩු සම්බන්ධ උදාහරණ සඳහා කරුණාකර පහත 6 වන පරිච්ඡේදය බලන්න.

2.3 දත්ත කඩවීම මගින් ඔබට අලාභ හෝ පාඩු සිදුවූවද වන්දි ඇගයීමේ වැඩපිළිවෙල සමඟ සම්බන්ධවීමට ඔබ බලාපොරොත්තු නොවන්නේ නම්, මෙම දැන්වීමට ප්‍රතිචාර වශයෙන් වැඩපිළිවෙලින් ඉවත් විය යුතුය. ප්‍රතිචාර පෝරමය මගින් ඔබට '*opt-out*' සඳහා විකල්පය ලබාදෙයි. වන්දි ඇගයීමේ වැඩපිළිවෙලින් ඉවත්වීම මගින් ඇතිවන ප්‍රතිවිපාක සම්බන්ධයෙන් කරුණාකර පහළ 3 වන පරිච්ඡේදය බලන්න.

2.4 ඔබ විසින් පෝරමය මගින් ලබාදෙන තොරතුරු NRFA වෙත යවනු ඇත. ඔබට විශ්වාසනීය ඉන්ටර්නෙට් සම්බන්ධතාවයක් නැතිනම්, ඔබ විසින් ප්‍රතිචාර පෝරමයේ කඩදාසි පිටපතක් සම්පූර්ණ කර Compensation Assessment Scheme, Norton Rose Fulbright Australia, Level 6, 60 Martin Place, SYDNEY, NSW 2000 වෙත තැපෑලෙන් යැවිය හැකිය. කරුණාකර ප්‍රතිචාර පෝරමයේ කඩදාසි පිටපතක් auscas@nortonrosefulbright.com යන ඊමේලය මගින් හෝ දුරකථන අංක (02) 9330 8006 ඔස්සේ NRFA සමඟ සම්බන්ධවී ලබා ගන්න.

2.5 ඔබ විසින් **2024 ජුනි 10** වන දින **පස්වරු 4** ට පෙර **(අවසාන දිනය)** මෙම දැන්වීමට ප්‍රතිචාර දැක්විය යුතුය. ඔබ විසින් ප්‍රතිචාර දැක්වීම සඳහා කාලය දීර්ඝ කිරීමක් ඉල්ලා සිටිය හැකි වුවද, එය ලැබෙන තෙක් එය ලැබෙන බවට තහවුරුවක් නැත.

2.6 දීර්ඝ කිරීම් සඳහා සියළු ඉල්ලීම් auscas@nortonrosefulbright.com යන ඊමේලය වෙත ඉදිරිපත් කල යුතුය, නැතිනම් ලියාපදිංචි තැපැල් මගින් Compensation Assessment Scheme, Norton Rose Fulbright Australia, Level 6, 60 Martin Place, SYDNEY, NSW 2000 වෙත යැවිය හැකිය. ඔබ විසින් දුරකථන අංක 02 9330 8006 ඔස්සේ NRFA හා සම්බන්ධවීම මගින්ද දීර්ඝ කිරීමක් ඉල්ලා සිටිය හැකිය.

2.7 **<u>ඔබ විසින් පළමු දැන්වීමට ප්‍රතිචාර දැක්වූයේ නැතිනම් සහ නියමිත දිනට පෙර ප්‍රතිචාර දැක්වූයේ නැතිනම් (සහ දීර්ඝ කිරීම සඳහා ඉල්ලීමක් ඉදිරිපත් නොකලේ නම්), දත්ත කඩ කිරීම හේතුවෙන් සිදුවුණු කිසියම් අලාභ හෝ පාඩු සඳහා වන්දි ලබාගත නොහැකි වනු ඇත.</u>**

## 3 වන්දි ඇගයීමේ වැඩපිළිවෙල වෙතින් 'ඉවත්වීම' යනුවෙන් කුමක් අදහස්වේද?

3.1 වන්දි ඇගයීමේ වැඩපිළිවෙල වෙතින් වන්දි ලබා ගතහොත් දත්ත කඩවීම සම්බන්ධයෙන් වෙනත් ආකාරයකට වන්දි ඉල්ලා සිටීමට ඇති සියළුම නෛතික අයිතිවාසිකම් (අධිකරණ ක්‍රියාමාර්ග ආරම්භ කිරීම ඇතුළු) නැතිවීම සම්බන්ධයෙන් දැනුවත් වන්න.

3.2 මෙයට හේතුව වන්දි ඇගයීමේ වැඩපිළිවෙල මගින් ඔබගේ ඉල්ලීම සාධාරණ ලෙස ඇගයීමකට ලක්කර ඔබ සහ දෙපාර්තමේන්තුව අතර ඇති කිසියම් ආරවුලක් අවසානයකට පත් කිරීම මෙහි අරමුණ වීමයි.

 © Norton Rose Fulbright Australia

3.3 වන්දි ඇගයීමේ වැඩපිළිවෙලට පරිබාහිරින් ඔබගේ නෛතික අයිතිවාසිකම් ඉල්ලා සිටීමට ඔබ අදහස් කරන්නේ නම්, දැන්වීමට ප්‍රතිචාර දක්වමින් ප්‍රතිචාර දැක්වීමේ පෝරමයේ 'ඉවත්වීම' යන විකල්පය තෝරා ගැනීම මගින් වන්දි ඇගයීමේ වැඩපිළිවෙල වෙතින් ඉවත් විය යුතුය. 'ඉවත්වීමට' තීරණය කිරීමට පෙර වෙනත් ආකාරයක ඉල්ලීමක් සම්න්ධ වියදම් සහ දුෂ්කරතා, දත්ත කඩවීමේ සිට මේ අවස්ථාව වන විට වන්දි ඇගයීමේ වැඩපිළිවෙලට පරිබාහිරින් ඉල්ලීමක් ඉදිරිපත් කිරීම සඳහා වැඩිපුර කාලයක් ගතවී ඇතිද යන තීරණය ඇතුළු කරුණු සම්බන්ධයෙන් නීති උපදෙස් ලබා ගන්නා ලෙස අපි ඔබව උනන්දු කරමු.

## 4 පළමු දැන්වීමට ප්‍රතිචාර වශයෙන් මා විසින් දැනටමත් තොරතුරු ලබාදී ඇතිනම් කුමක් සිදුවේද?

4.1 පළමු දැන්වීමට ප්‍රතිචාර වශයෙන් ඔබ විසින් තොරතුරු ලබාදී ඇතිනම්, ඔබට හිමි වන්දි සැලකිල්ලට ගැනීමේදී NRFA මගින් මෙම තොරතුරු සැලකිල්ලට ගනු ඇත. ඔබ විසින් නැවත එම තොරතුරුම ලබාදිය යුතු නැත.

4.2 දැන්වීමට ප්‍රතිචාර වශයෙන් යාවත්කාලීන හෝ අමතර තොරතුරු ලබාදීමට ඔබ අදහස් කරයි නම්, එය නියමිත දිනට පෙර ලබාදීම වැදගත්වේ.

## 5 මා විසින් පළමු දැන්වීමට ප්‍රතිචාර දැක්වූයේ නොමැතිනම් කුමක් සිදුවේද?

5.1 ඔබට NRFA වෙත වැදගත් තොරතුරු ලබාදීමට තවත් අවස්ථාවක් ඇත.

5.2 කෙසේවුවද, ඔබ විසින් පළමු දැන්වීමට ප්‍රතිචාර නොදැක්වීමට හේතුව පහදා දිය යුතුය. NRFA මගින් ඉන්පසුව ඔබ වන්දි ඇගයීමේ වැඩපිළිවෙලට සහභාගිවීම සඳහා සුදුසුකම් ඇතිදැයි ඇගයීමක් කරනු ඇත.

5.3 පළමු දැන්වීමට ප්‍රතිචාර නොදැක්වීමට හේතුවූ කරුණු අතර පහත දේ තිබිය හැකිය:

(1) ඔබට පළමු දැන්වීම නොලැබුණු බවට සාක්ෂි;

(2) ඔබගේ ප්‍රතිචාරය නිසි ලෙස OAIC වෙත නොලැබුණු බවට සාක්ෂි;

(3) ඔබ වන්දි සඳහා සුදුසුකම් නොලබන බවට වැරදි සහගත ලෙස සිතූ බව පැහැදිලි කරමින් ලිඛිත ප්‍රකාශනයක්;

(4) ඔබ විසින් පළමු දැන්වීමට ප්‍රතිචාර දැක්විය යුතු ආකාරය පිළිබඳ අවබෝධයක් නැති බව හෝ ප්‍රතිචාර දැක්විය යුතු ආකාරය නොදන්නා බව පැහැදිලි කරමින් ලිඛිත ප්‍රකාශනයක්; හෝ

(5) වෙනත් අවස්ථානුගත කරුණු (අසනීප තත්වය, ආර්ථික දුෂ්කරතා, හෝ පවුලේ සාමාජිකයන්ගේ රැකවරණ වගකීම් ආදී) හේතුවෙන් පළමු දැන්වීමට ප්‍රතිචාර දැක්වීම වැළැක්වූ බව පැහැදිලි කරමින් ලිඛිත ප්‍රකාශනයක්.

## 6 මා හට වන්දි ලබා ගත හැක්කේ කුමන ආකාරයේ පාඩු හෝ අලාභ සඳහාද?

6.1 වන්දි ඇගයීමේ වැඩපිළිවෙල මගින් පහත සඳහන් කරුණු සඳහා වන්දි ලබාදිය හැකිය:

(1) ආර්ථික පාඩු හෝ අලාභ (***Economic Loss***); සහ

(2) ආර්ථික නොවන පාඩු හෝ අලාභ (***Non-Economic Loss***).

6.2 වන්දි ඇගයීමේ වැඩපිළිවෙල මගින් දත්ත කඩකිරීම මගින් සිදුවුණු ආර්ථික පාඩු සහ ආර්ථික නොවන පාඩු සඳහා පමණක් වන්දි ලබාගත හැක. වන්දි ඇගයීමේ වැඩපිළිවෙල මගින් දත්ත කඩවීම හේතුවෙන් සිදු නොවුණු පාඩු හෝ අලාභ සම්බන්ධයෙන් වන්දි ලබාදිය නොහැක.

 © Norton Rose Fulbright Australia

<u>ආර්ථික පාඩු</u>

6.3 ආර්ථික පාඩු යනු දත්ත කඩවීම හේතුවෙන් ඔබ විසින් වියදම් කල මුදල් (ඔබ විසින් වියදම් කල මුදල්) හෝ ඔබට නොලැබුණු ආදායම (ආදායම නැතිවීම) වැනි ඔබට සිදුවූ ආර්ථික පාඩුවකි. මෙයට පහත කරුණු ඇතුලත් විය හැකිය:

(1) දත්ත කඩවීම හේතුවෙන් ඔබට අතින් ගෙවීමට සිදුවූ වියදම්. මෙම වියදම් අතර පහත කරුණුද ඇත:

(a) වෛද්‍ය වෘත්තිකයන් හමුවීමට යාම;

(b) බෙහෙත් සහ ප්‍රතිකාර; සහ

(c) වෛද්‍ය වාර්තා.

(2) දත්ත කඩවීම හේතුවෙන් රාජකාරි කිරීමට නොහැකිවීම මගින් ආදායම නැතිවීම; සහ

(3) දත්ත කඩවීම හේතුවෙන් ඔබට පහත කරුණු ඇතුළුව අතින් ගෙවීමට සිදුවූ වෙනත් වියදම්:

(a) දත්ත කඩවීම හේතුවෙන් OAIC වෙත කලින් ඉදිරිපත් කල පැමිණිලි හෝ පළමු දැන්වීමට ප්‍රතිචාර දැක්වීමට අදාල වියදම්: සහ

(b) දත්ත කඩවීම හේතුවෙන් ඔබගේ අනන්‍යතාවය ආරක්ෂා කිරීමට ගිය වියදම්.

<u>ආර්ථික නොවන පාඩු</u>

6.4 ආර්ථික නොවන පාඩු යනුවෙන් අදහස් වන්නේ මූල්‍යමය නොවන ආකාරයේ පාඩුවකි (උදා. කිසිදු ආර්ථික පාඩු මෙයට ඇතුලත් නොවේ). මෙම වියදම් අතර පහත කරුණුද ඇත:

(1) උත්සුකබව, ආතතිය, බිය, වේදනාව සහ විඳවීම, ලැජ්ජාවට පත්වීම හෝ අපහසුතාවයට පත්වීම;

(2) දත්ත කඩවීම හේතුවෙන් ඇතිවූ නින්ද නැතිවීම හෝ හිසරදය වැනි ශාරීරික සහ මානසික රෝග ලක්ෂණ; සහ

(3) දත්ක කඩවීම හේතුවෙන් ඇතිවූ හෝ උත්සුකවූ වෛද්‍ය වෘත්තිකයෙකු විසින් හඳුනාගත් උත්සුකබව හෝ විෂාදය වැනි රෝගී තත්වයන්.

## 7 මා විසින් NRFA වෙත කුමන ආකාරයේ තොරතුරු ලබාදිය යුතුද?

7.1 ප්‍රතිචාර පෝරමය මගින් ඔබට විශේෂිත තොරතුරු ලබාදෙන ලෙස ඉල්ලා සිටී. ඔබගේ වන්දි ඉල්ලීමට සහාය ලබා ගැනීම සඳහා අමතර සාක්ෂි ලබාදීමේ විකල්පයද ඔබට ඇත.

7.2 ආර්ථික පාඩු හෝ ආර්ථික නොවන පාඩු සඳහා වන්දි ඉල්ලා සිටීමේදී ඔබට ඇති හිමිකම සලකා බැලීමේදී NRFA මගින් විවිධ ආකාරයේ සාක්ෂි සලකා බලයි.

7.3 ඔබ විසින් ලබාදිය හැකි සාක්ෂි ආකාර සම්බන්ධ උදාහරණ පහත දක්වා ඇත:

<u>ආර්ථික පාඩු සම්බන්ධ ඉල්ලීමට සහාය ලබාදිය හැකි සාක්ෂි</u>

(1) දත්ත කඩවීමේ ප්‍රතිඵලයක් වශයෙන් ඔබට අතින් දැරීමට සිදුවූ වියදම් සම්බන්ධ රිසිට්පත් සහ වෙනත් වාර්තා. උදාහරණ වශයෙන් මෙම රිසිට් පත් අතර පහත ඒවා ඇත:

(a) දත්ත කඩවීම හේතුවෙන් වෛද්‍ය වෘත්තිකයන් සමඟ හමුවීම්;

(b) දත්ත කඩවීම හේතුවෙන් වෛද්‍ය වෘත්තිකයන් විසින් පිළියෙල කල වාර්තා;


© Norton Rose Fulbright Australia

(c) දත්ත කඩවීම සම්බන්ධයෙන් OAIC වෙත කලින් ඉදිරිපත් කල පැමිණිල්ල හෝ දත්ත කඩවීම හේතුවෙන් පළමු දැන්වීමට ප්‍රතිචාර දැක්වීමේදී ඔබට දරන්නට සිදුවූ වියදම් (නීති වෘත්තිකයන්ට ආදී අයට);

(d) දත්ත කඩවීම හේතුවෙන් ඔබගේ අනන්‍යතාවය ආරක්ෂා කර ගැනීම සඳහා දැරීමට සිදුවූ වෙනත් වියදම්.

(2) දත්ත කඩවීම හේතුවෙන් රැකියාව කිරීමට නොහැකිවීම නිසා ආදායම අහිමිවූ බවට සාක්ෂි වශයෙන් පඩිපත්, ඔබගේ සේවායෝජකයාගෙන් ලිපි, වෛද්‍ය සහතික සහ වෙනත් ලියකියවිලි; සහ

(3) දත්ත කඩවීම හේතුවෙන් ඔබට සිදුවූ ආර්ථික පාඩු පැහැදිලි කරන ඔබ, ඔබගේ පවුලේ සාමාජිකයන් හෝ ඔබට සමීප වෙනත් අය විසින් ලබාදුන් අත්සන් කල දිවුරුම් ප්‍රකාශ.

<u>ආර්ථික නොවන පාඩු සම්බන්ධ ඉල්ලීමට සහාය ලබාදිය හැකි සාක්ෂි</u>

(1) දත්ත කඩවීම හේතුවෙන් ඔබට සිදුවූ ආර්ථික අලාභ පැහැදිලි කරන ඔබ, ඔබගේ පවුලේ සාමාජිකයන් හෝ ඔබට සමීප වෙනත් අය විසින් ලබාදුන් අත්සන් කල දිවුරුම් ප්‍රකාශ. මෙම ප්‍රකාශ අතර ඔබගේ කායික මානසික සුබසිද්ධියට මෙය බලපෑ ආකාරයද සඳහන් කල හැකිය; සහ

(2) පහත කරුණු පැහැදිලි කරන වෛද්‍ය වෘත්තිකයෙකුගෙන් ලබාගත් වාර්තා සහ සහතික:

(a) දත්ත කඩවීම හේතුවෙන් ඔබට අත්විඳීමට සිදුවූ හෝ උත්සන්නවූ කිසියම් රෝගී තත්වයක්;

(b) දත්ත කඩවීම හේතුවෙන් ඔබගේ වෛද්‍ය වෘත්තිකයා සමඟ සිදුවූ කිසියම් හමුවීම්; සහ/හෝ;

(c) දත්ත කඩවීම හේතුවෙන් ඔබ විසින් ලබාගත් කිසියම් ප්‍රතිකාරයක්.

## 8 මෙම දැන්වීමට මා විසින් දුරකථනයෙන් ප්‍රතිචාර දැක්විය හැකිද?

8.1 ඔබ විසින් මාර්ගස්ථ පෝරමය (www.immigrationdatabreach.com.au වෙතින් ලබාගත හැක) ඔස්සේ ප්‍රතිචාර දැක්වුවහොත් වඩා කාර්යක්ෂමව සලකා බලන අතර මෙම දැන්වීමට දුරකථනයෙන් ප්‍රතිචාර දැක්වීමටද ඔබට හිමිකමක් ඇත.

8.2 කරුණාකර දුරකථන අංක (02) 9330 8006 ඔස්සේ NRFA අමතන්න.

## 9 සුදුසුකම් ලත් භාෂණ පරිවර්තකයන්

9.1 මෙම දැන්වීම විවිධ භාෂාවලින් ඇත. මෙම ලියවිල්ල ආරම්භයේ ඇති පුරුක වෙත යන්න.

9.2 මෙම දැන්වීමට ඔබ තෝරාගත් භාෂාවෙන් ප්‍රතිචාර දැක්වීමටද ඔබට හිමිකමක් ඇත. සුදුසුකම්ලත් භාෂණ පරිවර්තකයෙකුගේ සහාය ලබා ගැනීම සඳහා කරුණාකර auscas@nortonrosefulbright.com යන ඊමේලය ඔස්සේ හෝ දුරකථන අංක 02 9330 8006 ඔස්සේ NRFA සමඟ සම්බන්ධ වන්න.

## 10 මෙම දැන්වීමට ප්‍රතිචාර දැක්වීම සඳහා මා හට මූල්‍ය උපකාර ලබා ගැනීමට හිමිකම් තිබේද?

10.1 ඔව්. දැන්වීමට ඔබගේ ප්‍රතිචාරය නීති වෘත්තිකයෙකු විසින් පිළියෙල කරදුන් අවස්ථාවක වියදම පියවා ගැනීම සඳහා $500 දක්වා ඉල්ලා සිටීමට ඔබට හිමිකමක් ඇත. ප්‍රතිචාර දක්වන පෝරමය ඔස්සේ මූල්‍ය උපකාර ඉල්ලා සිටිය හැකිය.

10.2 වන්දි ඇගයීමේ වැඩපිළිවෙලට සහභාගිවන අවස්ථාවල වැඩසටහන් පරිපාලක විසින් ලබාදෙන භාෂා පරිවර්තන හෝ භාෂණ පරිවර්තන සේවා වෙනුවෙන්ද ඔබ විසින් ගෙවීමක් කල යුතු නැත (දැන්වීමේ සහ ප්‍රතිචාර දක්වන පෝරමයේ පරිවර්තිත පිටපත් ලබා ගැනීම ඇතුළුව).


© Norton Rose Fulbright Australia

## 11 ප්‍රශ්න සහ උපකාර

11.1 මෙම දැන්වීමට ප්‍රතිචාර දැක්වීම සඳහා උපකාර අවශ්‍ය නම් හෝ වෙනත් ප්‍රශ්න ඇතිනම්, දුරකථන අංක (02) 9330 8006 ඔස්සේ හෝ auscas@nortonrosefulbright.com යන ඊමේලය ඔස්සේ කරුණාකර NRFA සමඟ සම්බන්ධ වන්න.

## 12 ඔබගේ පුද්ගලිකත්වය

12.1 ඔබගේ පුද්ගලිකත්වය NRFA වෙත වැදගත්වේ. NRFA මගින් ඔබගේ පුද්ගලික තොරතුරු *ඕස්ට්‍රේලියානු පුද්ගලිකතා මූලධර්ම* ඇතුළුව *Privacy Act 1988* (Cth) අනුව පරිහරණය කරයි.

12.2 Administrative Appeals Tribunal වෙතින් නිකුත් කල නියෝග අනුව Department of Finance මගින් වන්දි ඇගයීමේ වැඩපිළිවෙල යටතේ ලබාදිය හැකි වන්දි ස්වාධීනව ඇගයීම සඳහා NRFA පත් කරන ලදී. NRFA මගින් එම අරමුණ වෙනුවෙන් ඔබගේ තොරතුරු රැස් කිරීම, භාවිතා කිරීම සහ හෙළිදරව් කිරීම සිදු කරනු ඇත. ඔබගේ පුද්ගලික තොරතුරු රැස් කිරීමට අමතරව, NRFA මගින් ඔබ සම්බන්ධ පුද්ගලික තොරතුරු OAIC සහ දෙපාර්තමේන්තුව වෙතින්ද රැස්කල හැකිය.

12.3 ඔබගේ පුද්ගලික තොරතුරු NRFA හට රැස් කිරීමට නොහැකි නම්, ඔබගේ වන්දි ඉල්ලීම NRFA මගින් ඇගයීම කල නොහැකි වනු ඇත.

12.4 NRFA වෙතින් ඔබගේ ඉල්ලීම අගයන විට, ඔබගේ පුද්ගලික තොරතුරු NRFA විසින් Department of Home Affairs සහ Department of Finance සමඟ බෙදාහදා ගැනීමට සිදුවනු ඇත. මෙයට හේතුව දෙපාර්තමේන්තුව මගින් ඔබගේ ඉල්ලීම අවබෝධ කර ගැනීමට සහ ඔබගේ ඉල්ලීමට ප්‍රතිචාර දැක්වීමටත් අපගේ ඇගයීමටත් උපකාර කිරීම සඳහාය. NRFA විසින් ඔබගේ පුද්ගලික තොරතුරු වෛද්‍ය සහ නීති වෘත්තිකයන් වැනි ස්වාධීන උපදේශකයන් සමඟද බෙදා හදා ගැනීම අවශ්‍යවේ.

12.5 අප විසින් ඔබගේ පුද්ගලික තොරතුරු ගබඩා කිරීම සම්බන්ධයෙන් කටයුතු කරන කාර්ය මණ්ඩලය සහ කොන්ත්‍රාත්කරුවන් සමඟ බෙදාහදා ගැනීමට සිදුවිය හැකිය. සමහර කාර්ය මණ්ඩලය සහ කොන්ත්‍රාත්කරුවන් එක්සත් රාජධානිය වැනි ඕස්ට්‍රේලියාවෙන් පිටත රටවල්වල සිටිය හැකිය.

12.6 NRFA හි පුද්ගලිකතා ප්‍රතිපත්තියෙහි ඔබ සම්බන්ධයෙන් අප ලඟ ඇති පුද්ගලික තොරතුරු වෙත ප්‍රවේශවීම සහ එම තොරතුරු නිවැරදි කරවා ගන්නා ආකාරය සම්බන්ධ තොරතුරු ඇතුලත්වේ. පුද්ගලිකතා ප්‍රතිපත්තියෙහි ඕස්ට්‍රේලියානු පුද්ගලිකතා මූලධර්ම කඩවී ඇති අවස්ථාවලදී පැමිණිල්ලක් සිදු කරන ආකාරය සම්බන්ධයෙන්ද තොරතුරු ඇතුලත්වේ. එසේම NRFA මගින් එවැනි පැමිණිල්ලක් සම්බන්ධයෙන් කටයුතු කරන ආකාරයද දක්වයි. NRFA හි පුද්ගලිකතා ප්‍රතිපත්තිය එහි වෙබ් අඩවිය වන website ඔස්සේ පහත ආකාරයට ප්‍රවේශ විය හැකිය:
https://www.nortonrosefulbright.com/en-au/global-statements/privacy-notice.

12.7 Department of Home Affairs සහ Department of Finance හි පුද්ගලිකතා ප්‍රතිපත්තිවල සමාන තොරතුරු ඇතුලත්වේ:

- Department of Home Affairs: https://www.homeaffairs.gov.au/access-and-accountability/our-commitments/privacy
- Department of Finance: https://www.finance.gov.au/about-us/privacy-policy-summary

12.8 ඔබ විසින් ලබාදුන් පුද්ගලික තොරතුරු නිවැරදි කර ගැනීම ඇතුළුව අප විසින් රැස් කරන පුද්ගලික තොරතුරු සහ ඔබගේ තොරතුරු අප විසින් පරිහරණය කිරීම සම්බන්ධයෙන් කිසියම් ප්‍රශ්නයක් ඇතිනම්, කරුණාකර auscas@nortonrosefulbright.com ඊමේල් ලිපිනය හෝ දුරකථන අංක (02) 9330 8006 ඔස්සේ Norton Rose Fulbright Australia සමඟ සම්බන්ධ වන්න.


© Norton Rose Fulbright Australia